036

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන- හයවන මට්ටම 2016/2017

අවසාන පරීක්ෂණය - 2018

ප්‍රාථමික අධ්‍යාපනය - ESU4117

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.02.06 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

<u>1 වන කොටස</u>

01. ප්‍රාථමික අධ්‍යාපන ගුරුවරයා තම පන්තියට පැමිණෙන ශිෂ්‍යයන් හඳුනාගැනීම අවශ්‍යම දෙයකි. පන්තිභාර ගුරුවරයෙකු විසින් ඉගෙනුම ලබන සිසුන් හඳුනාගැනීමේ අවශ්‍යතා (වැදගත්කම්) පහක් (05) ලියන්න.

02. ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයේ ප්‍රබලතා තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ප්‍රාථමික අධ්‍යාපන ක්‍රියාවලිය තුළ පවතින "ප්‍රවේශ නිපුණතා" යන සංකල්පය පැහැදිලි කරන්න.

04. වර්තමාන ප්‍රාථමික අධ්‍යාපන ක්‍රියාවලිය තුළ ප්‍රධාන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේද තුනක් (03) හඳුන්වා දී තිබේ. එම ක්‍රමවේද තුන (03) නම් කරන්න.

05. "අභිමත ඉගෙනුම් නිපුණතා" යන්න පැහැදිලි කරන්න.

06. පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා ප්‍රාථමික පාසල් කාලය ප්‍රධාන අවධිවලට වෙන්කර ඇත. ප්‍රාථමික අධ්‍යාපනයේ අවධිවලට බෙදීමේ පදනම පැහැදිලි කරන්න.

07. තක්සේරුකරණය විධිමත් සහ අවිධිමත් යනුවෙන් ක්‍රම දෙකකින් සිදු කරයි.

    අවිධිමත් තක්සේරුකරණ ක්‍රම හතරක් (04) නම් කර ඒ එකිනෙකට උදාහරණයක් බැගින් සඳහන් කරන්න.

08. සේවාස්ථ උපදේශකගේ(ගුරු උපදේශකගේ) කාර්යය වන්නේ ප්‍රාථමික පන්තිභාර ගුරුවරයාට සහාය වීමයි.

සේවාස්ථ ගුරුවරයෙකු වශයෙන් ප්‍රාථමික පන්තිභාර ගුරුවරයාට සහායවිය හැකි ආකාර **තුනක් (03)** කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## <u>02 වන කොටස</u>

09. (i) ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අදහස් ඉදිරිපත් කළ මහත්මා ගාන්ධි හැර වෙනත් දාර්ශනිකයින් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(ii) මහත්මා ගාන්ධි දර්ශනය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii) ගාන්ධි ඉදිරිපත් කළ තෙවැදෑරුම් සංවර්ධනය සහ ශ්‍රී ලාංකේය වත්මන් නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රමය පිළිබඳ ව සංසන්දනාත්මක ව විමසීමක් කරන්න. (ලකුණු 12)

10. වර්තමානයේ ක්‍රියාත්මක වන්නේ නිපුණතා පාදක කරගත් අධ්‍යාපනයකි. එය මූලික නිපුණතා හතක් (07) පදනම් කරගෙන ඇත.

(i) මූලික නිපුණතා පහක් **(05)** නම් කරන්න. (ලකුණු 05)

(ii) එම එක් මූලික නිපුණතාවක් සඳහන් කර ඊට ඇතුළත් විෂය පථය පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii) ඉහත සඳහන් කළ මූලික නිපුණතාව සංවර්ධනයට ප්‍රාථමික අධ්‍යාපන විෂය මාලාවේ ඇති ඉගෙනුම් අවස්ථා දෙකක් **(02)** පැහැදිලි කරන්න. (ලකුණු 08)

11. (i) "සමෝධානිත ප්‍රවේශය" යන්න පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පළමු ප්‍රධාන අවධියේ දී සෙල්ලම් සහ විනෝදජනක වැඩ සඳහා ප්‍රමුඛතාවය දීමේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 10)

12. (i) තක්සේරුකරණය සහ ඇගයීම යන සංකල්ප කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) "ප්‍රාථමික අධ්‍යාපන අවධියේ දී වඩා වැදගත් වන්නේ අඛණ්ඩ තක්සේරුකරණයයි."

ඉහත කියමන හා ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුර සනාථ කිරීමට කරුණු ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

13. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණ -1997 ඉදිරිපත් කරන ලදී. පහත මාතෘකා සම්බන්ධයෙන් වර්තමාන ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න.

(i) අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා (ලකුණු 06)

(ii) නිපුණතාවන්හි ප්‍රවීණතාවය (ලකුණු 08)

(iii) සෙල්ලම් මිදුල භාවිතය (ලකුණු 06)

14. (i) නාට්‍ය හා රංගකලාව ගුරුවරයෙකුට ප්‍රාථමික අධ්‍යාපනය ඉගෙන ගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) "ඵලදායී පන්තිකාමර කළමනාකරණ භූමිකාව සහ ප්‍රාථමික පාසල් ගුරුවරයා"

සංසන්දනාත්මකව විමසන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.